# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2211/8 - 2021 ජනවාරි මස 18 වැනි සඳුදා - 2021.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදනයයි

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2021 ජනවාරි මස 19 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවැතිය යුතු ය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 005276 — 575 (2021/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| 01. | 04.06 | 0406.20 | සියලුම වර්ගවල පෙරන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි. ග්‍රෑමයට රු. 200 |
| 02. | 09.09 | 0909.21 | කොත්තමල්ලි බීජ - කුඩු නොකළ හා නොඇඹරූ | කි. ග්‍රෑමයට රු. 26 |
| | | 0909.22 | කොත්තමල්ලි බීජ - කුඩු කළ හෝ ඇඹරූ | කි. ග්‍රෑමයට රු. 52 |
| 03. | 09.10 | 0910.30.10 | කහ - කුඩු නොකළ හා නොඇඹරූ | කි. ග්‍රෑමයට රු. 102 |
| | | 0910.30.90 | කහ - අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 360 |
| 04. | 11.06 | 1106.10.10 | උඳු පිටි | කි. ග්‍රෑමයට රු. 325 |

02— 4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.